**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම් - 2017**

---

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම්වල 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14/(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදවල දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය - සමූහය

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදවල දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම්වල මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට හා කුඩා හා මධ්‍ය පරිමාණ සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**තත්ත්වාගණනය කළ මතය - අධිකාරිය**

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම් -සමූහය

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය සහ පූර්ණහිමිකාරිත්වය සහිත පරිපාලිත සමාගම් 03 ක් ඒකාබද්ධ කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණු අතර එක් සමාගමක් ඇවරකරමින් පැවතුණි. එයින් ණයහිමියන්ගේ ගණන්බේරා වසාදැමීමේ කටයුතු සිදුකරනු ලබන මහවැලි වෙන්චර් කැපිටල් ( පුද්) සමාගමේ රු. 15,550,577 ක වත්කම් හා රු. 394,657 ක වගකීම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත්කර නොතිබුණි.

(ආ) අධිකාරිය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති හා එහි පරිපාලිත සමාගම් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර තිබුණද සමාගම විසින් අනුගමනය කරන ලද පදනම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

#### 2.2.2 කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රමිතයෙහි 17 පරිච්ඡේදයේ 17.19 වගන්තිය පරිදි මහවැලි උපදේශක සේවා කාර්යාංශ (පුද්ගලික ) සමාගමේ සහ මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද් ) සමාගමේ ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය පිළිවෙලින් රු. 3,035,306 ක් හා රු.7,313,171 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම විසින් ප්‍රමිතයෙහි 04 පරිච්ඡේදයේ 4.5 වගන්තිය ප්‍රකාරව මාස හයකින් කල්පිරෙන රු. 5,802,607 ක ස්ථාවර තැන්පතු ජංගම වත්කම් ලෙස වාර්තාකළ යුතු වුවද ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඇ) ප්‍රමිතයෙහි 28 පරිච්ඡේදයේ 28.18 වගන්තිය අනුව පාරිතෝෂික වෙන්කිරීමේදී පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය හෝ ඒ හා සමාන වෙනත් ක්‍රමයක් අනුගමනය කළ යුතු වුවද මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පුද්ගලික) සමාගම සහ මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික ) සමාගම විසින් සේවකයන් අවසන් වරට ලබාගත් වැටුප හා සේවා කාලය පදනම් කරගෙන පාරිතෝෂික වෙන්කිරීම් සිදුකර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයට අදාලව සිදුකර තිබූ පාරිතෝෂිත වෙන්කිරීම් ද පිළිවෙලින් රු.1,609,568 ක් සහ රු.1,216,096 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

## 2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම - අධිකාරිය

### 2.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 ප්‍රකාරව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.134,578,000 ක් වටිනා කෘෂි හා පශු සම්පත් තොගයේ වටිනාකම තක්සේරු කළ ආකාරය සටහනක් මඟින් හෙළිදරව්කර නොතිබුණි.

### 2.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

අධිකාරිය විසින් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වා දී නොතිබීම නිසා ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමානුකූල පදනමක් යටතේ විලම්භීත ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ශේෂය රු.මිලියන 24,404 ක් වී තිබුණි.

### 2.3.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් 1984 -1989 කාලපරිච්ඡේදය තුළ මිලදී ගෙන තිබුණු පිරිවැය රු.67,440,853 ක්වූ ඉඩම් කට්ටි 03 ක සාධාරණ වටිනාකම අගයකර ගිණුම්ගත කර නොතිබුණු අතර ඉන් ඉඩම් කට්ටි 02 ක් ගාස්තු ගෙවීමෙන් තොරව බාහිර පාර්ශවයන් විසින් භාවිතයට ගෙන තිබුණද ඒ සඳහා ගාස්තු අයකර නොතිබුණි.

(ආ) නිරාවිය ගොවිපල සහ මහවැලි බී හා එළු කලාපවල සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු.7,305,230 ක ප්‍රාග්ධන වියදම් පුනරාවර්තන වියදම් ලෙස දක්වා තිබුණි.

(ඇ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් මාර්ගස්ථ මුදල් ශේෂය තුල රු.38,251,826 ක වෙනත් ලැබිය යුතු ශේෂ දක්වා තිබුණි.

(ඈ) අධිකාරිය සතුව උඩවලව කලාපයට අයත් නිවාස 3 ක්, සයනාගාර 2 ක්, නිවාඩු නිකේතනයක් හා ගොඩනැගිල්ලක් පැවති අතර එහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙන් අධිකාරිය වෙත පවරා තිබුණු පිරිවැය රු.671,503,748 ක්වූ ස්ථාවර වත්කම් වලින් කොටසක් රු.180,131,037 කට ප්‍රත්‍යාගණනයකර ගිණුම්ගත කර තිබුණ ද ඉතිරි වත්කම් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඊ) නිරාවිය ගොවිපලේ වර්ෂය අවසානයේ පැවති රු.1,161,780 ක් වටිනා කිලෝ ග්‍රෑම් 24,750 ක පොහොර තොගය අවසන් තොගය ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(උ) මොරගහකන්ද ව්‍යාපෘතියෙන් හා ගංගා ද්‍රෝණි කාර්යාලයෙන් නිරාවිය ගොවිපල වෙත 2010 – 2016 කාලයතුල ලබා දී තිබුණු යතුරු පැදි 12 ක්, මල්ටි චොපර් යන්ත්‍ර 02 ක්, කිරි ප්‍රවාහන ලොරියක්, ට්‍රැක්ටර් 03 ක්, කුකුළු පාලන ගොඩනැගිලි 04 ක්, විද්‍යුත් බර මැණුම් උපකරණ 02 ක් හා බේලින් මැෂිම විධිමත්ව පවරා ගැනීමට හා වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) වික්ටෝරියා කලාපයේ පුස්තකාල පොත් 7,588 ක වටිනාකම් ගණනයකර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂ වෙනුවෙන් ලැබී තිබුණු රු. 12,620,622 ක හිඟ බදු කුලී ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද 2016 වර්ෂයේදී ආදායමට ගෙන තිබුණු 2015 වර්ෂයේ හිඟ බදු කුලී ආදායම වූ රු.20,960,226 ක් සමාලෝචිත වර්ෂයේ දී නිවැරදි කිරීමේදී එම ආදායම සමුච්චිත අලාභයට දෝෂ සහිතව බැර කර ලැබියයුතු බදුකුලී ගිණුම හර කිරීම හේතුවෙන් සමුච්චිත අලාභය හා ලැබිය යුතු බදු කුලී ගිණුම රු.41,920,452 කින් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) මහවැලි බී කලාපයේ ඉඩම්වලින් සමාගමක් විසින් සමලෝචිත වර්ෂයේ දී ලබාගත් වැලි කියුබ් 75,941 ක් වෙනුවෙන් ලැබියයුතු ඉඩම් පරිහරන ගාස්තුව වූ රු.37,970,500 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) මුදල් හා මුදල් සමාන දෑ වල ඇතුළත් රු.2,602,908 ක ඉතුරුම් තැන්පතු, රු.727,481 ක ස්ථාවර තැන්පතු හා රු.1,000,000 ක කෙටිකාලීන තැන්පතු සඳහා ලැබිය යුතු පොලිය හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඕ) ණය යෝජනා ක්‍රමයක් සඳහා 2006 වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලැබී ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවේ තැන්පත් කර ඇති රු.50,000,000 ක මුදල හා ඊට අදාල රු.16,196,761 ක පොලී මුදල අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 2.3.4 පැහැදිලි නොකළ වෙනස්කම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු දේපල පිරියත හා උපකරණ ක්ෂය හා මහවැලි පශු සම්පත් සමාගමේ ආයෝජනවල එකතු වටිනාකම රු.945,474,952 ක් වූ අතර අදාල උපයෝගී ලේඛනවල එම වටිනාකම රු.915,514,765 ක් ලෙස දක්වා තිබීම නිසා රු. 29,960,187 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ස්ථාවර වත්කම් කලාප අතර හුවමාරු කිරීමේදී කලාපවලට ස්ථාවර වත්කම් ලැබීම් හා කලාප විසින් නිකුත් කිරීම්, ගිණුම් ඒකාබද්ධ කිරීමේදී තුලනය වියයුතු වුවද, කලාපවලින් ලැබුණු වත්කම් රු.409,983,931 ක් ලෙස හා කලාපවලට යවනලද වත්කම් රු.266,936,487 ක් ලෙස දැක්වීමෙන් රු.143,047,444 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3.5 අවිනිශ්චිත ගිණුම්

අධිකාරියට අයත් පරිපාලිත සමාගමක මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.14,117,550 ක අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර එය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ ණයගැතියන් ලෙස දක්වා තිබුණි.

### 2.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් ශේෂ ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| ගිණුම විෂයය | විස්තරය | වටිනාකම<br>රු. | නොලැබුණු සාක්ෂි |
|---|---|---|---|
| ආයෝජන - ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | මහවැලි සත්ව ව්‍යාපාරික සමාගම | 10,000,000 | කොටස් සහතික |
| | මහවැලි වෙන්චර් කැපිටල් සමාගම | 10,398,000 | |
| | මහවැලි උපදේශක කාර්යාංශය සමාගම | 64,000 | |
| | සවාභාවික සම්පත් කළමනාකරණ සේවා සමාගම | 15,000 | |
| වත්කම් | ඉතිරිකිරීමේ ගිණුම | 2,632,908 | ශේෂ සනාථ කිරීම් හා බැංකු පාස් පොත |
| | ස්ථාවර තැන්පතු | 727,481 | තැන්පතු සහතික හා ශේෂ සනාථ කිරීම් |
| ආදායම් | එච්,උඩවලව හා වික්ටෝරියා කලාපවල බදුකුලී ආදායම | 518,363,565 | හිඟ බදු ලේඛන |

## 2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.712,249,000 ක ලැබිය යුතු බදුකුලී ආදායමක් වූ අතර ඉන් රු.24,776,000 ක් වර්ෂ 05 ක්ද රු.10,463,000 ක් වර්ෂ 03 සිට වර්ෂ 05 දක්වා කාලයක් ද ඉක්මවා තිබුණි. අධිකාරිය සතු ඉඩම් බදු දීම් වලින් බදු ආදායම් රැස්කිරීමට ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණු අතර බදු ආදායම් රැස්කිරීමට අදාල නියමයන් හා කොන්දේසි ක්‍රියාත්මක නොකිරීම හිඟ බදු ආදායම වාර්ෂිකව වැඩි වීමට හේතු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වැඩ පූර්ව අත්තිකාරම් රු.535,226,000 ක් වූ අතර ඉන් රු.3,466,000 ක් වර්ෂ 05 ඉක්මවා තිබුණද අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) විදුලිය, ජලය හා පවිත්‍රතා වියදම් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත අධිකාරියට අයත් ගොඩනැගිලි බාහිර පාර්ශවයන් වෙත ලබාදී තිබූ අතර පාර්ශව 05 කින් වර්ෂ 04 ට වැඩි කාලයක සිට රු.4,030,119 ක වියදම් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. එසේම අධිකාරියට අයත් රු.104,394,675 ක් වටිනා ගොඩනැගිලි බාහිර පාර්ශව 13 ක් විසින් භාවිතයට ගන්නා නමුත් ඒ සඳහා කුලියක් අයකර ගැනීමට 2017 දෙසැම්බර් 31 දින වනවිටත් අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගෙවිය යුතු ගිණුම්වල වටිනාකම රු.766,474,000 ක් වූ අතර, ඉන් රු.23,779,000 ක් වසර 05 ඉක්මවා තිබුණි.එම ශේෂවල ඇතුළත් රු.9,857,000 ක අත රඳවුම් මුදල්වලට අදාල කොන්ත්‍රාත් වැඩවල සම්පූර්ණත්වය තහවුරු කර ගෙන රඳවුම් මුදල් නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි.

(ඉ) 2010 වර්ෂයේදී අධිකාරිය සතු කලංකුට්ටිය ගොවිපලෙන් අක්කර 25 ක ප්‍රමාණයක් වෙනත් අමාත්‍යාංශයකට අයත් පශු සම්පත් ව්‍යාපාරික සමාගමට විධිමත් පරිදි බදු දී නොතිබුණු අතර 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අයවිය යුතු බදු මුදල රු.10,035,000 ක් වී තිබුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2013 අංක 17 දරන එකතු කළ අගය මත බදු (සංශෝධිත) පනතේ 10 (ආ) වගන්තිය | මාස 12 කාලසීමාවකදී භාණ්ඩ හා සේවා සැපයුම්වල මුළු වටිනාකම රු.මිලියන 12 ඉක්මවන්නේ නම් පනත යටතේ එකතුකළ අගය මත බදු සඳහා ලියාපදිංචි වියයුතු නමුත් අධිකාරිය විසින් අදාල ආදායම් ප්‍රභවයන්ගෙන් ඉකුත් වර්ෂයේදී රු.මිලියන 87 ක් හා සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 93 ක ආදායමක් රැස්කර තිබුණද එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචිවීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 104 (4) | වාහන අනතුරු 12 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අදාල වාර්තා විගණනය වෙත ලබාදී නොතිබුණු බැවින් අලාභ ප්‍රමාණය හා ඊට වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අලාභ අයකරගැනීමට කටයුතුකර ඇත්දැයි පරීක්ෂාකළ නොහැකි විය. |
| (ii) මුදල් රෙගුලාසි 757 | අධිකාරියේ කලාප 08 ක ස්ථාවර වත්කම් සමීක්ෂණ වාර්තා විගණනය වෙත ලබාදී නොතිබුණි. |
| (ඇ) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව වාහන අපහරණයෙන් ලැබෙන ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී වාහන අපහරණයෙන් ලැබී තිබුණු රු.36,521,474 ක් අනුමැතියකින් තොරව අධිකාරිය විසින් රඳවාගෙන තිබුණි. |
| (ඈ) 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 හා 2016 මාර්තු 24 දිනැති අංක 1/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛවල 3.2 ඡේදය හා 2.3.3 ඡේදය | චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව ව්‍යාපෘති සඳහා නිදහස්කර තිබුණු නිලධාරීන් 03 දෙනෙකුට අනුමැතියකින් තොරව ව්‍යාපෘතියේ සේවය කරන ලද කාලය වෙනුවෙන් අධිකාරිය විසින් රු. 4,282,668 ක වැටුප් ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | අධිකාරියේ මූල්‍ය කාර්යපරිපාටි සංග්‍රහයේ 1.5.1 ඡේදය, අධ්‍යක්ෂ ජනරාල්ගේ 02/2012 හා 2012 මාර්තු 15 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛයේ 05 වගන්තිය | අත්තිකාරම් මුදල ලබාගත් කාර්යය නිම වී දින 07 ක් ඇතුලත පියවියයුතු වුවද කලාප 10 ක හා අංශ දෙකකට අදාල වර්ෂ එකකට වඩා වැඩි නොපියවූ රු. 156,851,005 ක සැපයුම් අත්තිකාරම් විය . |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී සමූහයේ හා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.437,478,000 ක හා රු.433,846,000 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.34,600,000 ක් හා රු.37,851,000 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි පිළිවෙලින් රු.402,878,000 ක හා රු.395,995,000 ක ඌනතාවයේ වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. අධිකාරියේ වියදම් රු.337,305,000 කින් වැඩිවීම ඌනතාවයේ වැඩිවීමට මූලික වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ රු.350,271,000 ක්ව පැවති අධිකාරියේ ඌනතාවය 2013, 2015 හා 2016 වර්ෂවලදී අඩුවී 2014 වර්ෂයේදී වැඩිවී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය හා බදු නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු.1,876,561,000 ක්ව පැවති අධිකාරියේ දායකත්වය 2013, 2014 හා 2015 වර්ෂවලදී අඛණ්ඩව වැඩිවී 2016 වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී අඩුවෙමින් පැවතුණි.

### 3.2 අධිකාරියට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

බාහිර ආයතන හා පුද්ගලයන් විසින් නිවාස සන්තකය ආපසු ලබාගැනීමට හා පාරිතෝෂික නොගෙවීම සම්බන්ධයෙන් අධිකාරියට එරෙහිව නඩු 18 ක් ගොනු කර තිබුණු අතර එහි මූල්‍ය බැදීම රු.මිලියන 43.775 ක් වී තිබුණි.

### 3.3 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආදායම් රැස්කිරීමේ දී පවතින අඩුපාඩු හේතුවෙන් රාජ්‍ය භාගය ලැබීම් හා නිවාස/ඉඩම් කුලී ආදායම 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු. 203,347,000 න් අඩුවෙන් ලැබී තිබුණි.

(ආ) ජනපදිකයින් පුනරුත්ථාපනය, වර්ධනය හා නඩත්තු වියදම් 2016 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුලදී රු.330,300,000 න් වැඩිවී තිබුණු අතර 2016/2017 වර්ෂවලදී බී කලාපයේ ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මෙයට හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

### 4.1.1 සැලසුම් කිරීම

රාජ්‍ය ව්‍යවසායේ ව්‍යාපාර කටයුතු කෙටිකාලීන හා දිගුකාලීන දැක්මක් සහිතව කළමනාකරණය කළ යුතු බැවින් 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 වගන්තිය අනුව අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඒ අනුව යෝජිත ඉලක්ක ළගා කර ගැනීමට හැකි වන පරිදි ව්‍යාපාරය මෙහෙයවීම අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ වගකීම වුවත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් එපරිදි සංයුක්ත සැලැස්ම සකස්කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කර නොතිබුණි. තවද 2017 වර්ෂයට අදාල කාර්යසාධනයට අනුකූලව සකස් කරන ලද සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම 2017 දෙසැම්බර් 21 දින අධ්‍යක්ෂ මණ්ඩල විසින් අනුමත කර තිබුණි. ක්‍රියාකාරී සැලැසුමට අනුව සකස්කරන ලද අධිකාරියේ ප්‍රගති වාර්තා 2018 සැප්තැම්බර් 31 දින වනවිටද විගණනයට ලබා දී නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි මහ සැලැස්මට අනුව මහවැලි ගඟේ ඝන මීටර් මිලියන 6,900 ක පමණ වූ ජල ප්‍රමාණයෙන් විදුලි බල නිෂ්පාදනයට හා වාරි කටයුතු සඳහා ජලය සැපයීමට සැලසුම් කර තිබුණි. එසේම මහ සැලැස්මට අනුව මහවැලි කලාප 13 ක ඉඩම් හෙක්ටයාර් 365,853 ක් සඳහා වාරි පහසුකම් සැපයීමට යෝජිතව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් හෙක්ටයාර 85,252 ක් සඳහා වාරි පහසුකම් සපයා තිබුණු අතර විදුලි බලය නිෂ්පාදනය සඳහා යෙදවීමට යෝජිත ජලාශ 11 න් ජලාශ 06 ක පමණක් ජල විදුලිය නිෂ්පාදනය කර තිබුණි.

(ආ) ඉඩම් අංශය විසින් ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ගෙවතු, වාරි හා කෘෂි වර්ෂා පෝෂිත කටයුතු සඳහා පිළිවෙලින් ඉඩම් අවසර පත්‍ර 13,550 ක්, 2530 ක්, 580 ක් බෙදා දීමට සැලසුම්කර තිබුණද පිළිවෙලින් අවසර පත්‍ර 12,093 ක්, 2,032 ක් හා 426 ක් බෙදා ද තිබුණි. ගෙවතු, වාරි හා කෘෂි වර්ෂා පෝෂිත කටයුතු සඳහා පිළිවෙලින් ප්‍රදාන පත්‍ර 10,260 ක්, 3,525 ක් හා 3,070 ක්, බෙදා දීමට සැලසුම්කර තිබුණද පිළිවෙලින් ප්‍රදාන පත්‍ර 8,668 ක්, 2,876 ක් හා 2,568 ක් බෙදා දී තිබුණි. වාණිජ කටයුතු, ආයෝජන ව්‍යාපෘති හා නිවාස බදු පදනමට ලබා දී රු.216,789,000 ක මුදලක් රැස්කිරීමට ඉලක්කකර තිබුණද රු.189,084,000 ක් පමණක් රැස්කර තිබුණි.

(ඇ) අධිකාරිය යටතේ ක්‍රියාත්මක ධීවර හා පශු සම්පත් අංශයේ ඉලක්කගත හා තත්‍ය වශයෙන් ලඟාකර ගත් ප්‍රගතිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

(i) අධිකාරියේ සියයට 50 දායකත්වය මත ජනපදිකයින් වෙත කුකුළු පැටවුන් බෙදාහැරීම සඳහා රු.3,065,000 ක ප්‍රතිපාදන වෙන්කර පැටවුන් 37,716 ක් බෙදාදීමට අපේක්ෂා කර තිබුණද රු.2,679,000 ක් වැයකර පැටවුන් 29,012 ක් පමණක් බෙදාහැර තිබුණි.

(ii) මහවැලි කිරි ගොවීන්ගේ සතුන් 158 ක් රක්ෂණය සඳහා රු.191,000 ප්‍රතිපාදනයකර තිබුණු අතර රු.36,000 ක් වැයකර සතුන් 50 ක් පමණක් රක්ෂණයකර තිබුණි.

(iii) සුරතල් මත්ස්‍ය අභිජනනය සඳහා වන සතුන් බෝකිරීමේ ඒකක 20 පිහිටුවීම සඳහා රු.1,970,000 ක ප්‍රතිපාදනය කර තිබුණු අතර රු.474,000 ක් වැයකර ඒකක 8 ක් පමණක් පිහිටුවා තිබුණි.

(ඇ) ව්‍යාපාර සංවර්ධන අංශය ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම

---

(i) විගණනයට ඉදිරිපත්කරන ලද කලාප 06 තොරතුරු අනුව දිගුකාලීන ඉඩම් බදුදීම් 418 ක් අතුරින් සාර්ථකව ව්‍යාපාර පවත්වාගෙන යන ආයෝජකයින් 153 ක් වූ අතර, ඒ අතරින් ආයෝජකයින් 28 දෙනෙකුගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු බදු කුලිය රු.21,194,183 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ii) සංවර්ධනය කර නොමැති ඉඩම් 158 ක් වූ අතර, මුළු බදු දුන් ඉඩම් ප්‍රමාණයෙන් එය සියයට 38 ක් විය. ඉන් ව්‍යාපාර 38 ක් සඳහා රු.6,891,708 ක හිඟ ශේෂ අයවීමට තිබූ අතර, එම බදු අයකර ගැනීමට හෝ අධිකාරිය වෙත නැවත ඉඩම් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) අන්සතු, අනවසරකරුවන් ව්‍යාපාර කරනු ලබන, වසා ඇති, නවතා ඇති, ව්‍යාපාර ආරම්භ කර නැති, සංවර්ධනය වෙමින් පවතින ව්‍යාපාර 60 කින් ව්‍යාපාර 20 ක් සඳහා අයවියයුතු හිඟ බදු මුදල රු. 1,509,893 ක් වී තිබුණි.

(iv) ඩී හා බී කලාපවල ආයෝජන ව්‍යාපෘති සඳහා ලබාදුන් ඉඩම් අක්කර 3,489.19 කින් සංවර්ධනය කරන ලද ඉඩම් ප්‍රමාණය අක්කර 1,334.09 ක් හෙවත් මුළු ලබාදුන් ඉඩම්වලින් සියයට 38.23 ක් පමණක්වී තිබුණු නමුත්, ඊට හේතු සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(v) එල්'' කලාපයේ අක්කර 755 ක් වැනි විශාල ඉඩම් ප්‍රමාණයක් ආයෝජකයින් 30 දෙනෙකු සඳහා 2013 හා 2014 වර්ෂවලදී ලබාදී ඇති නමුත්, විගණිත දිනය වූ 2018 ඔක්තෝබර් 31 දින වනවිටද කිසිදු සංවර්ධනයක් සිදුකර නොතිබුණි. මෙවැනි විශාල ඉඩම් ප්‍රමාණයක දැව ඉවත් කර සංවර්ධන කටයුතු සඳහා ඉඩම් ලබාදී තිබුණද, ආයෝජකයින්ගේ ඉඩම්වල තිබූ වගාවන් වල් අලීන් විසින් විනාශ කර ඇති බව වාර්තා අනුව සනාථ විය. ව්‍යාපාර සඳහා ඉඩම් ලබාදීමට පෙර සුදුසු ඉඩම් තෝරා නොගැනීම නිසා වන සතුන්ගෙන් වගා හානි වලක්වාගත නොහැකිවී තිබීම හේතුවෙන් ඉඩම් ලබාදුන් අරමුණ ඉටුවී නොතිබුණු අතර විශාල පරිසර හානියක්ද සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය.

(ඉ) ව්‍යාපාර සංවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක ණය වැඩසටහන්

---

- "මහවැලි සවිය'' ණය වැඩසටහන සඳහා අධිකාරිය විසින් ජනපදිකයින් වෙත ණය ලබාදීම වෙනුවෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුමට අනුව අධිකාරිය 2010 වර්ෂයේදී රු.72,750,000 ක් බැංකුව වෙත ලබාදී තිබුණි. ණය නිකුත් කිරීමට යොදා නොගත් අරමුදල් වෙනුවෙන් සාමාන්‍ය ඉතිරි කිරීමේ පොළියට සමාන පොළියක් අධිකාරියට ලැබිය යුතු වුවද 2011 සිට 2017 වර්ෂය දක්වා එක් එක් වර්ෂවලදී ඉතිරි මුදල් ශේෂවල එකතු වටිනාකම රු.335,850,255 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට කිසිදු පොළියක් ලබාගෙන නොතිබුණු අතර එම ශේෂ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. එසේම අවබෝධතා ගිවිසුමේ 04 වන වගන්තියට පටහැනිව අධිකාරියේ සේවකයින් තිදෙනෙක් වෙත ද රු.650,000 ක ණය ලබාදී තිබුණි.

- මහජන බැංකුව සමඟ 2013 ජනවාරි 07 දින ඇතිකරගත් අවබෝධතා ගිවිසුම අනුව ජනපදිකයින්ට ව්‍යවසායකත්ව සංවර්ධනය කිරීමට ණය ලබාදීම සඳහා "මහවැලි අරුණ" ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර ඇති අතර, ණයකරු ගෙවන පොලිය හා ප්‍රකාශිත පොලිය අතර වෙනස අධිකාරිය දරනු ලබයි. අවබෝධතා ගිවිසුමේ 02 වගන්තියට

පටහැනිව අධිකාරියේ සේවකයන් තිදෙනෙක් වෙත ද රු. 600,000 ක ණය ලබා දී තිබුණි. මෙහි ඉලක්කගත අරමුණෙහි යොදවා ඇත්ද, ඉන් නිසි ප්‍රතිලාභ ලබාගෙන ඇත්ද, ණය ආපසු ගෙවීමේ ප්‍රගතිය කෙසේද යන්න පිළිබඳව පසුවිපරම් කර නොතිබුණි.

- 2015 වර්ෂයේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ ඇතිකරගත් අවබෝධතා ගිවිසුම අනුව "මහවැලි දිරිය" ණය යෝජනා ක්‍රමය යටතේ එක් එක් කලාපවල ගොවි සංවිධානවල සාමාජිකයින්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා කලාප 02 කට පමණක් රු.15,435,000 ක් නිදහස් කර තිබුණද කලාප 08 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.
  එම එක් කලාපයක් වූ "එච්" කලාපයේ ගොවි සංවිධානයක් මඟින් ණයකරුවන් වෙත උපරිම ණය සීමාව වූ රු. 200,000 ඉක්මවා ජනපදිකයින් තිදෙනෙක් වෙත අනුමැතියකින් තොරව රු.1,250,000 ක ණය ලබා දී තිබුණි.

- අධිකාරිය, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමග ඇති කරගත් අවබෝධතා ගිවිසුම අනුව 2017 වසරේ සිට ක්‍රියාත්මක මොරගහකන්ද කලාපයේ ව්‍යාපාරික අත්වැල ණය යෝජනා ක්‍රමය සඳහා 2016 අගෝස්තු 04 දින මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘතියෙන් ලැබුණු රු.මිලියන 25 ක මුදල අධිකාරිය විසින් අදාල කාර්යයට නොයොදවා ජංගම ගිණුමක රඳවා ගෙන තිබුණි. පසුව එය 2017 වර්ෂයේදී බැංකුව වෙත තැන්පත් කර තිබුණද එය අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. අවබෝධතා ගිවිසුම අනුව ණය නිකුත් නොකරන මුදල් වෙනුවෙන් සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුම්වල පොළියට සමාන පොළියක් අධිකාරියට ලැබිය යුතු වුවත්, 2017 වර්ෂය අවසානයට අරමුදලේ ඉතිරි ශේෂය වන රු.6,368,400 ක් සඳහා පොළියක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයෝජකයින්ගේ යෝජනා අනුව ඉහළ මහවැලි ජලාධාර ප්‍රදේශයේ මහවැලි ගඟේ ප්‍රධාන අතු ගංගාවල ජලය සහ රක්ෂිත ඉඩම් භාවිතාකරමින් ක්‍රියාත්මක වන සුළු පරිමාණ ජල විදුලි බලාගාර 46 ක් සහ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලැබී තිබුණු ජල විදුලි බලාගාර 24 ක් පැවතියද අධිකාරිය පනතේ 3(1), 12 සහ 13 වගන්ති ප්‍රකාරව රාජ්‍ය භාගය අයකර ගැනීමට වැඩපිළිවෙලක් සකස්කර නොතිබුණි. එසේම 2013 වර්ෂයේදී සුළු පරිමාණ ජල විදුලි බලාගාර 3 ක් ඉදිකිරීම සඳහා ආයෝජකයින්ට ලබා දී තිබුණු ඉඩම්වලින් ගිවිසුම් ප්‍රකාරව නාමික අගයක් වශයෙන් රු.25,733,500 ක බදුකුලියක් අයවියයුතුව තිබියදී පසුව ඉඩමේ නොදියුණු වටිනාකම අනුව මෙම මුදලින් රු.3,681,600 ක් අයකර ගැනීමට අධිකාරිය විසින් එන්තරවාසි යවා තිබුණද මෙතෙක් එම මුදලද අයවී නොතිබුණි.

(ආ) ජාවත්ත ප්‍රදේශයේ පිහිටි අධිකාරියට අයත් නොවන ඉඩම්වල රු.76,580,000 ක් වටිනා ගොඩනැගිලි ඉදිකර තිබුණු අතර එම ඉඩම්වල අයිතිය අධිකාරිය වෙත පවරා ගැනීමට 2017 දෙසැම්බර් 31 දින වනවිටත් කටයුතුකර නොතිබුණි.

(ඇ) අධිකාරිය විසින් පරිපාලිත සමාගම් 05 හි සිදුකර තිබුණු රු. 439,000,000 ක ආයෝජනයන් සඳහා කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහවැලි සී කලාපයේ පිහිටි ගල්වලවල් 03 කින් ඉවත්කළ කලුගල් කියුබ් 1943 ක් සඳහා අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛය ප්‍රකාරව කියුබ් එකක් සඳහා රු.1,000 බැගින් අයකළ යුතු වුවද කියුබ් එකකට රු.300 ක් අයකිරීම හේතුවෙන් රු.1,065,750 ක් අඩුවෙන් ආදායම රැස්කර තිබුණි. එසේම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය විසින් කියුබ් 20934 ක් සඳහා රාජ්‍ය භාගය අයකරගෙන තිබුණද අධිකාරිය විසින් කියුබ් 1943 ක් පමණක් කැණීම්කර ඇති බව සලකා ගාස්තු අයකිරීම නිසා රු.20,206,750 ක් අඩුවෙන් ආදායම රැස්කර ගෙන තිබුණි.

(ආ) මහවැලි බී කලාපයේ සිංහපුර කොට්ඨාශයේ නිවාස කඳවුරේ නිවාසවල විදුලි බිල්පත් හිඟව පැවතීම නිසා විදුලිය සම්බන්ධතාවය විසන්ධි කර තිබුණු අතර, හිඟ විදුලි බිල්පත් ගෙවිය යුතු නිවාස හිමියන් හඳුනාගෙන අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අධිකාරියේ නිරාවිය ගොවිපලට අයත් අක්කර 26 ක් පමණ ඉඩම් 1989 වර්ෂයේදී අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය විසින් අංක එල්/4/තබු/6/102 දරන බදු ගිවිසුමෙන් තිස් අවුරුදු කාලයකට මහවැලි පශු සම්පත් ව්‍යාපාරික සමාගම වෙත බදුදී තිබුණි. බාහිර පාර්ශවය විසින් සිදුකර තිබුණු මෙම බදුදීම නිවැරදි කර අධිකාරිය වෙත බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වැලිකන්ද කලාපයේ සිංහපුර හා අසේලපුර කොට්ඨාශවලට අයත් අක්කර 589.8 ක ඉඩම් කැබලි 12 ක් සුදු හඳුන් වගාව සහ පොල් වගාව සඳහා තිස් අවුරුදු පදනමට බදුකර මඟින් පුද්ගලයන් 12 දෙනෙක් වෙත ලබා දීමට 2013 ජූනි 25 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය දී තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) නිතර වන අලි ගැවසෙන කාසන් වැව සහ මාදුරු ඔය වම් ඉවුර ඇලට යාබදව කැලෑ සහිත ප්‍රදේශයක මෙම ඉඩම් පිහිටා තිබුණු බව 2018 අගෝස්තු 9 දින සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර පරිසර අධිකාරියේ හා වන ජීවි දෙපාර්තමේන්තුවේ අනුමැතිය හා නියමයන්ට අනුකූලව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) කලාපයේ භෞතික සැලසුම්කරු, පරිසර නිලධාරී හා ව්‍යාපාර සංවර්ධන නිලධාරීන් එක්ව 2015 වර්ෂයේ දී කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාව අනුව ඉඩම් අංක 2137 යටතේ හෙක්ටයාර 10 ක භූමියේ සඳුන් වගා කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණද 2018 වර්ෂය දක්වාම එහි වගා කිරීම් සිදුකර නොතිබුණි. විගණන භෞතික පරීක්ෂාවේදී තවත් හෙක්ටයාර් 40 ක කිසිදු වගාවක් සිදුකර නොතිබූ බව නිරීක්ෂණය විය.

(iii) බදුකරුවන් විසින් වගාවන් සඳහා අධිකාරියට අයත් කාසන් වැවේ සහ මාදුරු ඔය වම් ඉවුර ඇලේ ජලය භාවිතා කළද 2014 ජූලි 17 දිනැති MASL/DDG(Dev)/15 දරන අභ්‍යන්තර චක්‍රලේඛය ප්‍රකාරව ගාස්තු අයකිරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(iv) බදු ඔප්පු 12 ක් වාණිජ බැංකුවක් වෙත උකස්කර රු.780,000,000 ක ණය ලබාගෙන තිබුණු අතර දීර්ඝකාලීන බදුකරයේ කොන්දේසි අනුව උකස්කළ දින සිට දින 21 ක් ඇතුළත උකස පිළිබඳව අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම් දී නොතිබුණි.

(ඉ) මහවැලි බී සහ එල් කලාප සඳහා ප්‍රති ආශ්‍රිත ජල පිරිපහදු යන්ත්‍ර 30 ක් සැපයීම, ඉදිකිරීම, සවිකිරීම, ඊට අනුෂාංගික පහසුකම් සැපයීම, වසර දහයක කාලයක් නඩත්තු කිරීම සහ නියමිත ප්‍රමිතියෙන් යුතු ජල සැපයුම සහතික කිරීම අරමුණු කරගෙන රු.මිලියන 80 ක් වටිනා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අධිකාරිය හා ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව 2015 සැප්තැම්බර් 11 දින ගිවිසුම් ගතවී තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මේ සඳහා 2015 වර්ෂයේ අයවැයෙන් ප්‍රතිපාදන වෙන්කර නොතිබුණු බැවින් රු.මිලියන 80 ක ප්‍රතිපාදන කලාප දෙකක ව්‍යාපෘති දෙකකින් ලබා ගෙන තිබුණි. මුළු පිරිවැය ඇස්තමේන්තුව අනුමතකර නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 හා අතිරේක 33 ප්‍රකාරව රු.මිලියන 100 දක්වා විවෘත තරඟකාරී ක්‍රමය යටතේ සැපයුම්කරු තෝරාගත යුතු වුවද ප්‍රති ආශ්‍රිත ජල පිරිපහදු යන්ත්‍ර වැනි උපකරණ සැපයීම, සවිකිරීම සහ නඩත්තුව සඳහා සෘජු කොන්ත්‍රාත් ක්‍රමයට සැපයුම්කරු තෝරාගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 සහ 5.4.8 ප්‍රකාරව ලබාගත යුතු අත්තිකාරම් සුරක්ෂණ සහ කාර්යයසාධන සුරක්ෂණ ලබාගෙන ද නොතිබුණි.

(ii) ගිවිසුම්ගත කාලය 2015 නොවැම්බර් 30 දිනට අවසන් වී තිබුණද එදින වන විට ගිවිසුම්ගත කාර්යය අවසන් වී නොතිබුණි. කෙසේ වුවද ඒ සඳහා ප්‍රමාද ගාස්තු අයකරගැනීමට හැකිවන කොන්දේසි ගිවිසුමට ඇතුළත් කර නොතිබුණි.

(iii) වැඩ අවසන් පිරිපහදු යන්ත්‍ර / යන්ත්‍රාගාරය සහ එම උපාංග ජාතික ප්‍රජා ජලසැපයුම් දෙපාර්තමේන්තුවෙන් අධිකාරිය විසින් භාරගෙන විධිමත් ගිවිසුම් මඟින් එහි පරිපාලන කටයුතු ගොවි සංවිධාන වෙත භාර දිය යුතු වුවත් වැඩ නිමකළ යන්ත්‍රාගාර සම්බන්ධයෙන් එසේ සිදුකර නොතිබුණි.

(iv) ගිවිසුම් ප්‍රකාරව මහවැලි අධිකාරිය විසින් ජල මූලාශ්‍රය ලෙස නළ ළිං ඉදිකිරීම, අවශ්‍ය අධීක්ෂණ කටයුතු හා මෙහෙයවීම, ජල පිරිපහදු යන්ත්‍රාගාරය වෙනුවෙන් ගොවි සංවිධාන සඳහා දැරීමට සිදුවන විදුලි ගාස්තු, සේවක වියදම් සහ ජල අලෙවියෙන් ලැබෙන ආදායම් පිළිබඳ වාර්තා තබාගැනීම සහ අධීක්ෂණය සිදුකර නොතිබුණි.

(v) ගිවිසුම් ප්‍රකාරව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් වගකීම් සහිත ජල පිරිපහදු යන්ත්‍ර සැපයීම සහ සවිකිරීම , පිරිපහදු ජලයේ තත්ත්වය මසකට වරක් සහතික කර එම පරීක්ෂණ වාර්තා මාසිකව නේවාසික ව්‍යාපාර කළමනාකාර කාර්යාලයට ඉදිරිපත් කිරීම, අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු, සේවා සැපයීම සහ අමතර කොටස් සැපයීම, අමතර කොටස් සහ ජල පෙරණ වසර 10 ක කාලයක් නඩත්තු කිරීම සිදුකර නොතිබුණි.

(vi) වකුගඩු රෝගයෙන් පීඩාවට පත් මහවැලි ජනපදිකයින්ට අවශ්‍ය පිරිසිදු පානීය ජලය ලබා දීම සඳහා රු. මිලියන 80 ක මුදලක් වියදම්කර වසර තුනකට ආසන්න කාලයක් ගත වී තිබියදී එම ආයෝජිත මුදලේ ප්‍රතිලාභ අදාල ගම්මානවල ජනපදිකයින්ට ලැබී තිබේද එහි ප්‍රගතිය කුමක්දයන්න සොයා බැලීමට පසුවිපරම් අධිකාරිය විසින් සිදු කර නොතිබුණි. කෙසේ වුවද වැලිඔය කලාපයේ සවිකර තිබුණු ජල පිරිපහදු යන්ත්‍ර 12 න් 03 ක් අක්‍රීය වී තිබුණු අතර පිරිපහදු යන්ත්‍ර 09 කින් ජලය නිකුත්කර තිබුණද ජලය සුදුසු තත්ත්වයේ පවතීද යන්න මාසිකව පරීක්ෂාකර නොතිබුණි. වැලිකන්ද කලාපයේ ඉදිකර තිබුණු පිරිපහදු යන්ත්‍ර 18 න් යන්ත්‍රාගාර 14 ක් ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි.

(ඊ) මහවැලි එච්, සී හා වලව කලාපවල හා අධිකාරියේ මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශයේ පවතින ගොඩනැගිලි හා නිවාස 247 ක් විධිමත්ව බාහිර පාර්ශව වෙත බැහැර කර නොතිබීම හේතුවෙන් අධිකාරියට උපයාගත හැකිව තිබුණු ආදායමක් අහිමි වී තිබුණි .

(උ) මහවැලි ආරක්ෂක බලකාය සතු රු.26,030,780 ක් වටිනා ගොඩනැගිල්ලක්, පුහුණු ශාලා 03 ක් හා නිල නිවාස 24 ක් 2012 දෙසැම්බර් 24 දින සිට තාවකාලික පදනමින් කොත්මලේ ජාත්‍යන්තර පුහුණු ආයතනයට භාරදී තිබුණද බාරදුන් දින සිට ඒ සඳහා කිසිදු ගාස්තුවක් අයකර නොතිබුණි.

(ඌ) ඉඩම්වලින් බදු අයකිරීමේ වගකීම අධ්‍යක්ෂ (ඉඩම්) සහ නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (ඉඩම්) වෙත පවරා තිබුණද එම වගකීම එක් එක් කලාපය භාර නේවාසික ව්‍යාපාර කළමනාකරුවන් වෙත සහ කලාපයේ අදාල නිළධාරීන් වෙත විමධ්‍යගත කරමින් ඔවුන්ගේ රාජකාරී ලැයිස්තුවලට ඇතුළත් කර නොතිබුණු අතර වෙනත් ආදායම් මූලාශ්‍ර වලින් ඉපයිය හැකි ආදායම් රැස්කිරීමේ වගකීම් කිසිදු නිළධාරියෙකුගේ රාජකාරී ලැයිස්තුවලට ඇතුළත් කර නොතිබුණි. එම හේතුවෙන් සී කලාපය,එච් කලාපය, වික්ටෝරියා කලාපය, ප්‍රධාන කාර්යාලය හා වන හා පරිසර අංශය විසින් සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම් රැස්කර ගැනීමේ ප්‍රගතිය සියයට 37 සිට සියයට 66 දක්වා අවම අගයක් ගෙන තිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැලි කැණීම් මංකඩ පරීක්ෂාව.

(i) මහවැලි බලප්‍රදේශයට අයිති මහවැලි ගඟේ නව වැලි මංකඩවල් ආරම්භකිරීමට සුදුසු ස්ථාන නිර්දේශ කිරීමට 2015 හා 2016 වර්ෂවලදී අධිකාරිය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා මධ්‍යම පරිසර අධිකාරිය එක්ව පවත්වා තිබුණු ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණයෙන් නිර්දේශකර නොතිබුණු ස්ථාන 50 ක් සඳහා සී කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකරුගේ ඉල්ලීම අනුව වන ජීවී අධ්‍යක්ෂ ජනරාල් විසින් පසුව අනුමැතිය ලබා දී තිබුණි. එම අනුමැතිය මත කැණීම් බලපත්‍ර ලබාගෙන වැලි කැණීම් සිදුකර තිබුණි.

(ii) ඉඩම් හිමියා වශයෙන් අධිකාරිය විසින් මේ සම්බන්ධයෙන් විධිමත් හා නිරන්තර පසුවිපරම් කර නොතිබීම හේතුවෙන් එම කලාපයේ වැලි මංකඩ 16 ක වැලි මංකඩ පවත්වා ගෙන යාමේදි පරිසර අධිකාරිය හා වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පනවා තිබුණු කොන්දේසි උල්ලංඝනය කර තිබූ බව විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(iii) මාසයකට අදාල ඉඩම් පරිහරණ ගාස්තුව පමණක් ගෙවා මාස 12 ක කාලයක් වැලි කැණීම්කර තිබුණු නමුත් 2015 අගෝස්තු 24 දිනැති අංක ඩීඑල්/1/1 දරන මහවැලි අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ඉතිරි මාස 11 සඳහා කැණීම් බලපත්‍ර 386 කින් කණින ලද වැලි කියුබ් 807,194 ක් සඳහා ඉඩම් පරිහරණ ගාස්තු වශයෙන් රු.509,861,400 ක් අයකර ගැනීමට සී කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය කටයුතු කර නොතිබුණි. පසු විපරම් කටයුතු සිදු කළේ නම් මෙය හඳුනා ගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හැකියාව තිබුණි.

(ආ) වික්ටෝරියා කොත්මලේ කලාපය විසින් 2013 වර්ෂයේදී හෙක්ටයාර 3.593 ක ඉඩම් 03 ක් හුණුගල් ඉවත් කර ගැනීම සඳහා පුද්ගලයින් තිදෙනෙකුට බදු දී තිබුණි. ඔවුන් විසින් 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ඉවත්කරගත් හුණුගල් කියුබ් 31,684 ක් සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශයට රාජ්‍ය භාගය ගෙවා තිබුණි. ඒ අනුව 2015 අගෝස්තු

24 දිනැති අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛය ප්‍රකාරව කියුබ් 1 ක් සඳහා රු.300 බැගින් රු.3,937,500 ක් අධිකාරිය වෙත ගෙවිය යුතු වුවද රු.1,004,580 ක් පමණක් ගෙවා තිබුණි. එක් බදුකරුවෙකුට 2016 දෙසැම්බර් 31 දින දක්වා හිඟ මුදල වූ රු.3,937,500 ක් සඳහා එන්තරවාසියක් යවා තිබුණද ගෙවීම්කර නොතිබුණු නමුත් ඊට අවශ්‍ය ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) විදුලි රැහැන් පද්ධති ඉදිකිරීම විදුලිබල මණ්ඩලය විසින් කළයුතු කාර්යයක් වුවද, මාදුරු ඔය 1 හා 2 විදුලි බලාගාරවල ධාරිතාවය වැඩිකිරීම සඳහා නව විදුලි රැහැන් පද්ධතියක් ආයෝජකයෙකු විසින් රු.150,000,000 ක පිරිවැයක් දරා ඉදිකර තිබුණි. මෙම වියදම ආයෝජකයා හා අධිකාරිය අතර රාජ්‍ය භාගය බෙදාගන්නා 65.8 : 34.2 අනුපාතයට බෙදාගත යුතු බව ඒ සඳහා පත්කළ කමිටුවකින් නිර්දේශකර තිබුණි. එසේම අධිකාරියට ආයෝජකයාගෙන් ලැබෙන රාජ්‍ය භාගය හා අධිකාරිය විසින් ආයෝජකයාට ගෙවියයුතු මුදලට හිලව්කරගැනීම සඳහා මහවැලි අධිකාරිය, විදුලිබල මණ්ඩලය සහ ආයෝජකයා අතර ත්‍රෛයිපාර්ශවික ගිවිසුමකට එළඹියයුතු බව අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. අදාල පාර්ශවයන් ත්‍රෛයිපාර්ශවික ගිවිසුමකට එළඹ නොතිබුණු අතර උක්ත කමිටු නිර්දේශය අනුව ආයෝජකයා දරනලද වියදමින් රු.51,300,000 ක් අධිකාරිය විසින් දැරියයුතු වුවද ඊට පටහැනිව රු.75,000,000 ක් අධිකාරියට ලැබෙන රාජ්‍ය භාගයෙන් අඩුකර ගෙන තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අයත් නිරාවිය ගොවිපලේ රු.7,347,608 ක් වටිනා සතුන් 383 ක් ජාතික පශු සම්පත් හා සංවර්ධන මණ්ඩලය වෙත භාරදී තිබුණි. සතුන්ගේ වටිනාකම අයකර ගැනීම සඳහා එකඟත්වයක් දෙපාර්ශවය අතර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසානයට පශු සම්පත් තොගයේ වටිනාකම අයකර ගැනීමට නොහැකිවී තිබුණු අතර අයවියයුතු මුදලක් ලෙස හෝ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඉ) තඹුත්තේගම නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අයත් එප්පාවල පොස්පේට් නිධිය සහිත හෙක්ටයාර් 17.942 ක ඉඩම 1992 අප්‍රේල් 09 දිනැති ගිවිසුම අනුව අවුරුදු 30 ක කාලයක් සඳහා රාජ්‍ය පතල් කැනීම් හා ඛනිජ සංවර්ධන සංස්ථාව වෙත බදු දී තිබුණි. ඉඩම බදු දීම පළාත් ඉඩම් කොමසාරිස් මගින් සිදු වී තිබූ අතර ගිවිසුම් ප්‍රකාරව බදු මුදල පළාත් ඉඩම් කොමසාරිස් වෙත ගෙවිය යුතුව තිබීමෙන් 1992 වර්ෂයේ සිට 2017 වර්ෂය අවසානය දක්වා කිසිදු බදු මුදලක් මහවැලි අධිකාරියට අයවී නොතිබුණි. පසුව අධිකාරිය 2016 ජනවාරි 01 දින සිට 2017 දෙසැම්බර් 31 දක්වා අවස්ථා දෙකකදී ගාස්තු අයකිරීම සඳහා ලංකා පොස්පේට් සමාගම සමඟ ගිවිසුම් ගතවී කැණීම් කරන ඇපටයිට් කියුබ් එකක් සඳහා රු.300 ක සේවා ගාස්තුවක් අයකිරීමට එකඟ වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාගම විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු මත පමණක් 2017 වර්ෂයේ කැනීම් කළ කියුබ් 6,011 ක් සඳහා රු. 1,809,738 ක් අයකර ගෙන තිබුණි.

(ii) සමාගම විසින් කොන්ත්‍රාත්කරු වෙත සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත ගෙවීම් කිරීමේදී කැනීම් කරන ඇපටයිට් බර ප්‍රමාණය පදනම් කරගෙන තිබුණු අතර, මහවැලි අධිකාරියට ගෙවීමේදී ඇපටයිට් කියුබ් ප්‍රමාණය පදනම් කරගෙන තිබීම නිසා අධිකාරියට මූල්‍ය පාඩුවක් සිදුවන බව නිරීක්ෂණය විය.

(iii) අංක LUS/SYS-H/PP/1-VOL-1-2015 දරන 2015 නොවැම්බර් 23 දිනැති ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව අදාල සේවා ගාස්තු අය කිරීම සඳහා ක්‍රමවේදයක් හා මිල ගණන් සකස් කරන තෙක් පමණක් ඇපටයිට් කියුබ් 01 කට රු. 300 බැගින් අයකිරීම් කර තිබුණද, උක්ත පරිදි සේවා ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කර ගෙන නොතිබුණි.

## 4.5 අරමුදල් ඌන උපයෝජනය

2002 වර්ෂයේ ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා චක්‍රීය අරමුදලක් ඇති කිරීමේ අරමුණින් රු. මිලියන 48 ක් ඌව සංවර්ධන බැංකුවේ හා රජරට සංවර්ධන බැංකුවේ ආයෝජනය කර තිබුණද එම බැංකු සමඟ ඇති කරගත් ගිවිසුම් කොන්දේසි අනුව කටයුතු කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂය අවසානයට තැන්පතු වටිනාකම රු. මිලියන 84.5 ක් වූ අතර ගිවිසුම් ප්‍රකාරව සාමාන්‍ය ඉතුරුම් පොලියටත් වඩා අඩු සියයට 4 ක පොලියක් යටතේ මෙම අරමුදල් දීර්ඝ කාලයක් බැංකුවල රඳවා තැබීම අනාර්ථික කටයුත්තක් වී තිබුණි. තවද චක්‍රීය අරමුදලෙන් බලාපොරොත්තු වූ කාර්යය 2018 වර්ෂය දක්වාම සිදුකර නොතිබුණි.

## 4.6 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 සැප්තැම්බර් දින රහිත MA/Asset/Build/Gen/01 මුදල් අංශයේ වාර්තාව අනුව අධිකාරියේ කලාප 10 කට හා අංශ 02 කට අදාලව 2017 වර්ෂය වනවිට ගොඩනැගිලි 1,055 ක් බාහිර පාර්ශව විසින් භාවිතා කරන අතර ගොඩනැගිලි 551 ක් හා ගොඩනැගිලි 293 ක් නිෂ්කාර්යව හා භාවිතා කළ නොහැකි තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය විය.

(ආ) නිරාවිය ගොවිපල තුළ නවතා දමා තිබෙන ලොරි 02 ක්, ට්‍රැක්ටර් 03 ක් හා ටේලරයක්, බවුසරයක් හා යතුරුපැදියක්, නිවාස 15 ක්, ගොඩනැගිලි 03 ක්, කුකුළු කොටු 12 ක්, ඌරු කොටු 05 ක් හා එළු ගාලක් නිෂ්කාර්යව පැවති අතර එම වත්කම් අපහරණය කිරීමට හෝ ප්‍රයෝජනයට ගැනීමට හෝ විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) පොල්ගොල්ලේ පිහිටා තිබූ භූගෝලීය තොරතුරු පද්ධති ( GIS ) අංශය 2007 වර්ෂයේදී කොත්මලේ පරිසර හා වන සංරක්ෂණ අංශයට මාරු කර තිබීම නිසා අංශය සතුව පැවතුණු පරිගණක 02 ක්, ලැප්ටොප් එකක්, යූපීඑස් 02 ක්, ජීපීඑස් උපකරණ 03 ක්, ප්‍රින්ටර් 03 ක්, ඩිජිටල් කැමරාවක්, ඩිජිටල් සේප්පුවක් හා ස්කැනර්යක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඈ) නිරාවිය ගොවිපලේ ඉදිකරනලද ජල පොම්පාගාර 02 කට ජල පොම්ප සපයා නොතිබීම හේතුවෙන් පොම්පාගාරයේ කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකිව පැවතුණි.

## 4.7 වෙනත් ආයතන වෙත ලබාදුන් අධිකාරියේ සම්පත්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ මහවැලි ආරක්ෂක බලකායට අනුයුක්ත සහකාර ආරක්ෂක සුපරීක්ෂකවරු සහ ආරක්ෂක නියාමකවරු 44 දෙනෙකු බාහිර රාජ්‍ය ආයතනවලට නිදහස්කර තිබූ අතර නිදහස්කළ දින සිට සමාලෝචිත වර්ෂය දක්වා අධිකාරියෙන් ගෙවන ලද රු. 49,974,569 ක වැටුප් හා රු.21,571,442 ක අතිකාල හා ගමන් වියදම් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ආ) අධිකාරියට අයත් වාහන 18 ක් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත ලබා දී තිබුණද එසේ ලබාදීමට දුන් අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවූ අතර මෙම වාහනවල පැවැත්ම භෞතික පරීක්ෂාවකින් තහවුරු කරගෙන නොතිබුණි. එසේම ජනාධිපති ලේකම් කාර්යාලයට තාවකාලිකව ලබා දී තිබුණු එක් වාහනයක් අනතුරට ලක්වී අලුත්වැඩියාවකින් තොරව 2017 අප්‍රේල් 06 දින සිට ජාවත්ත මහවැලි ආරක්ෂක බලකා අනුඛණ්ඩයේ තබා තිබුණි.

(ඇ) 2015 වර්ෂයේ සිට විවිධ ව්‍යාපෘතිවලට පූර්ණ කාලීනව නිදහස්කර තිබුණු නිලධාරීන් හා සේවකයින් 09 දෙනෙකු වෙත ගෙවා තිබුණු වැටුප් රු. 17,936,683 ක් සහ රේඛීය අමාත්‍යාංශයට හා වෙනත් රාජ්‍ය ආයතනවලට නිදහස්කළ නිලධාරීන් හා සේවකයින් 18 දෙනෙකු වෙනුවෙන් ගෙවා තිබුණු වැටුප්, අතිකාල හා ගමන් වියදම් රු.19,106,596 ක් ප්‍රතිපූරණය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 14 ක්, මධ්‍යම කළමනාකරණ මට්ටමේ තනතුරු 159 ක්, ප්‍රාථමික මට්ටමේ තනතුරු 509 ක පුරප්පාඩු පැවති අතර 195 ක කාර්ය මණ්ඩලයක් අතිරික්තව පැවතුණි. තවද අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ තනතුරු සඳහා 83 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ආ) අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන), අධ්‍යක්ෂ (ඉඩම්), අධ්‍යක්ෂ ( පිරිස් හා පාලන), අධ්‍යක්ෂ (ධීවර හා පශු සම්පත්), අධ්‍යක්ෂ (සංවර්ධන) හා "සී" කලාපය, "බී" කලාපය, හුරුළුවැව කලාපය, රඹකැන්ඔය කලාපය හා ජී කලාපවල නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකරුවන් බඳවාගැනීමේ කාර්යය පරිපාටි ප්‍රකාරව නියමිත බඳවා ගැනීම් ක්‍රියාපටිපාටි අනුගමනය කර සුදුසු නිලධාරීන් ස්ථිරව බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. කොන්ත්‍රාත් පදනමින් හා ද්විතීක පදනමින් පුරප්පාඩු ඇතැම් තනතුරුවල රාජකාරි ආවරණය කිරීම නිසා නියමිත සුදුසුකම් සහිතව ස්ථිර පදනමින් අධිකාරියට බඳවාගනු ලබන නිලධාරීන්ගෙන් දීර්ඝකාලීනව ලැබෙන සේවය හා ඉහළ කාර්යසාධනය ලබාකර ගැනීමට තිබුණු අවස්ථාව ඇහිරී තිබුණි.

**4.9 වාහන උපයෝජනය**

මූලික වැඩපාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශයේ 2008 වර්ෂයේ සිට අක්‍රීයව පැවතුණු වාහන 10 ක් 2010 මාර්තු 09 සහ 2014 ජනවාරි 22 දිනැති මූලික වැඩපාලන හා ක්‍රියාකරවුම් අධ්‍යක්ෂකගේ ලිපි මඟින් අපහරණය කිරීමට හා ටෙන්ඩර් මඟින් විකිණීමට නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්) වෙත හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා) වෙත දැනුම් දී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටද එපරිදි කටයුතු කිරීමට අපොහොසත් වී තිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. එසේ දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක කරා ළඟා වියයුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 06 ක් ප්‍රමාදව 2018 සැප්තැම්බර් 28 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණද ඒ සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

### 6.2 අභ්‍යන්තර විගණනය

2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අධිකාරියේ අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) තනතුර පුරප්පාඩු වී පැවතුණු අතර එම තනතුර සඳහා සුදුසුකම්ලත් අධ්‍යක්ෂවරයකු පත්කිරීමට කටයුතු නොකර එහි රාජකාරි ඉටුකිරීම සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක පත්කර තිබුණි .

### 6.3 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 6.3.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැලිකන්ද නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයට අයත් වැඩ අංශයේ හා අරලගංවිල බීජ ගොවිපලේ ගබඩාවේ මුර කුටිය හා වැසිකිළි ඉදිකිරීම සඳහා රු.1,922,818 ක කොන්ත්‍රාත්තුවක් ලබාදී තිබුණු අතර 2017 නොවැම්බර් 07 දින වැඩ ආරම්භ කර දින 90 කින් නිම කළයුතුව පැවතුණි. කොන්ත්‍රාත් කාලය අවස්ථා 03 කදී දීර්සකර තිබූ අතර තෙවන කාලය දීර්ඝ කිරීම 2018 මැයි 22 සිට 2018 ජූනි 02 දක්වා විය. නමුත් විගණිත දිනය වූ 2018 අගෝස්තු 07 දින වනවිටද වැඩ අවසන් කර නොතිබුණු අතර ඒ සඳහා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමක් හෝ අදාල ප්‍රමාද ගාස්තුව වූ රු.34,610 ක් අයකර ගෙන නොතිබුණි. එසේම ඉදිකිරීමේදී ලී සහ ඇස්බැස්ටර්ස් යොදා වහලය සැකසීම වෙනුවට කොන්ක්‍රීට් ස්ලැබයක් යෙදීම හා ලී දොර ජනෙල් වෙනුවට ඇලුමිනියම් දොර ජනෙල් යෙදීමට ඇස්තමේන්තුව සංශෝධනයකර තිබුණද සංශෝධිත ඇස්තමේන්තුව අනුමත කර ගැනීමට 2018 සැප්තැම්බර් 30 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ආ) ගිවිසුම්ගත වටිනාකම රු.1,884,610 කට රුහුණුකෙත සංචාරක බංගලාව වටා වැට හා ප්‍රධාන ගේට්ටුව ඉදිකිරීමට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණු අතර විගණිත දිනය වූ 2018 අගෝස්තු 07 වන විට රු.549,822 ක් වැයකර සංචාරක බංගලාව වටා වැටක් ඉදිකර තිබුණද එය වන අලි විසින් හානි කර තිබීම නිසා විනාශයට පත්වී තිබුණි. මෙම ප්‍රදේශය නිතර වන අලි ගැවසෙන බැවින් වැට ඉදිකිරීමට ප්‍රථම ශක්තිමත් විදුලිවැටක් සකස්කර නොගෙන කම්බි වැට ඉදිකිරීම හේතුවෙන් දරන ලද මුදල නිෂ්කාර්ය වැයක් බව නිරීක්ෂණය විය.

(ඇ) තඹුත්තේගම කලාපයේ කොන්ත්‍රාත් කාලසීමාව ඉක්මවා තිබූ කොන්ත්‍රාත් 03 ක කාර්යයන් විගණිත දිනය වූ 2018 ජූලි 18 දින වන විටද අවසන් කර නොතිබුණි. වැඩ අවසන් කර නොතිබුණු මෙම කොන්ත්‍රාත් සඳහා කාලය දීර්සකිරීම් ලබාගැනීම සඳහා ඉල්ලුම් කර නොතිබූ අතර, නියමිත දිනට කොන්ත්‍රාත් නිමකිරීමට අපොහොසත්වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ගිවිසුම ප්‍රකාරව රු.1,025,776 ක ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6.4 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විෂයයන් 6 ක සියයට 81 ක සිට සියයට 38,445 ක් දක්වා වූ පරාසයක අයවැයගත ප්‍රතිපාදන සීමාව ඉක්මවා සත්‍ය වශයෙන් වියදම් දරා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණු ක්‍රියාකාරකම් 04 ක් සඳහා රු.27,968,000 ක් වැයකර තිබුණු අතර රු.32,497,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණු ක්‍රියාකාරකම් 08 ක් සඳහා කිසිදු වියදමක් සිදුකර නොතිබුණි.

## 6.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

-------------------------------

2015 හා 2016 වර්ෂවලට අදාලව අධිකාරියේ වාර්ෂික වාර්තා 2018 ඔක්තෝබර් 30 දින වන විටද පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6.6 නොවිසඳී ඇති විගණන ඡේද

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලංකා විදුලිබල මණ්ඩලයේ ලංකාවේ මුළු ජල විදුලිබල නිෂ්පාදනයෙන් සියයට 50 ක් පමණ මහවැලි ජලාශ ආශ්‍රිතව ඉදිකර ඇති ජල විදුලිබලාගාර මඟින් නිපදවන අතර, පොල්ගොල්ල, වික්ටෝරියා සහ කොත්මලේ යන ජලාශවල වේලි මත වූ විදුලි පහන් සඳහාද අධිකාරිය විසින් ලංකා විදුලිබල මණ්ඩලයට විදුලි ගාස්තු ගෙවන බව නිරීක්ෂණය විය. ජලාශ නඩත්තුව හා විදුලිබල මණ්ඩලය ප්‍රයෝජනයට ගන්නා ජලය වෙනුවෙන් ගාස්තු ගෙවීමක්ද සිදුනොකරන බැවින්, මෙම ප්‍රධාන වේලිවල විදුලි අවශ්‍යතාවය නොමිලේ සපයා ගැනීමට අධිකාරිය අවධානය යොමු කළයුතුව පැවතුණි.

(ආ) පොල්ගොල්ල, කොත්මලේ, බෝවතැන්න, මාපාකඩ, මාදුරුඔය හා වික්ටෝරියා ජලාශ ආශ්‍රිත රක්ෂිත භූමි භාග තුළ අනවසර පදිංචිකරුවන් 655 ක් සිටින බව හෙළිදරව් වූ අතර, මෙම අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට හා නැවත පදිංචිවන අනවසර පදිංචිකරුවන් පැමිණීම වැලැක්වීමට අධිකාරිය අපොහොසත්වී තිබුණි.

(ඇ) 1992 ජුලි 08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම් තීරණය හා 1992 ඔක්තෝබර් 14 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම් තීරණවලට අනුව ඇමරිකා එක්සත් ජනපදයේ සමාගමක් වෙත චිත්‍රපට ස්ථාන සංකීර්ණයක් හා ක්‍රියාකාරී භූමිභාගයක් ඉදිකිරීම සඳහා ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු වටිනාකමින් සියයට 06 ක හා උපරිමය සියයට 10 කට නොවැඩි වටිනාකමකට දිගුකාලීන බදු ප්‍රතිශතයකට යටත්ව වසර 50 ක කාලසීමාවකට අධිකාරියේ දිගන පිහිටි ඉඩම සහ ගොඩනැගිලි සංකීර්ණය ලබාදීමට අනුමැතිය ලබාදී තිබුණි. 1993 මැයි 21 දින සමාගම සමඟ එළඹි අවබෝධතා ගිවිසුමට ගොඩනැගිලි සංකීර්ණය සහ භූමිය රු.මිලියන 20 කට තක්සේරුකර තිබුණද බදු ගිවිසුම්වලට ඇතුළත් වී නොතිබුණි. ඒ අනුව විගණනයේ ගණනය කිරීම්වලට අනුව 2016 දෙසැම්බර් 31 දිනට අයවියයුතු කුලිය රු. 28,800,000 ක් හා ගිවිසුම් ප්‍රකාරව ලබාදී ඇති නිවාස 11 වෙනුවෙන් අයවියයුතු බදුකුලිය රු.4,542.500 ක් වී තිබුණි. වර්තමානයේ මෙම වත්කම් වල සන්තකය ආපසු ලබාගැනීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබුණද අවසන් තීරණයකට එළඹීමට අපොහොසත් වී තිබුණි.

(ඈ) දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතියට අවශ්‍ය පස් ලබාදීමේදී වලව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ නිලධාරීන් විසින් නිසි සැලැසුමකට අනුව ඉඩම් ලබා නොදීම නිසා අනුමත සීමාව ඉක්මවා පස් කපා තිබුණු අතර මිනුම් වාර්තාවන්ට අනුව පස් කැපීම සඳහා ලබා දී තිබුණු ස්ථාන දෙකෙන් කපා ඉවත් කර තිබුණු පස් ප්‍රමාණය කියුබ් 157,719 ක් වූ නමුත් පස් කියුබ් 5,000 ක් සඳහා පමණක් රු. 2,800,000 ක ඉඩම් පරිහරණ ගාස්තු අධිකාරිය වෙත ලැබී තිබුණි. වැඩියෙන් ඉවත්කර ගන්නා ලද පස් කියුබ් 152,719 ක් සඳහා ලැබියයුතු රු.85,522,640 ක් අයකරගෙන නොතිබුණි. මෙම මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාද වීම නිසා මෙම මුදල් අයකරගැනීම සැකසහිතවී තිබුණි. අදාල නිලධාරීන්ට එරෙහිව ගෙන තිබුණු විනය ක්‍රියාමාර්ග ගැනීම මන්දගාමී ස්වරූපයක් ගෙන තිබුණි.

(ඉ) 2016 වර්ෂයේදී වික්ටෝරියා කලාපයට පවරාගත් වෝටර් ෆීල්ඩ් ආයතනයේ ගොඩනැගිලිවල වටිනාකම තක්සේරුකර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

## 7 පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් ක්ෂේත්‍රයන් පිළිබඳව අධිකාරියේ විශේෂ අවධානය යොමු කළයුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | වත්කම්වල පැවැත්ම තහවුරුකර ගැනීම සඳහා වාර්ෂික වත්කම් සත්‍යාපන සිදුකර තිබුණද අදාල වාර්තා ඉදිරිපත් කර නොතිබීම, නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග නොගැනීම. |
| (ආ) | ඉඩම් හා ගොඩනැගිලි උපයෝජනය | බාහිර පාර්ශවයන් විසින් ගොඩනැගිලි කුලී රහිතව ප්‍රයෝජනයට ගැනීම හා කලාපවල ගොඩනැගිලි නිෂ්කාර්යව පැවතීම සහ ඛණිජ සම්පත් සහිත ඉඩම් නිසි පරිදි කළමනාකරණය කර ආදායම් උපයා ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) | ගිණුම්කරණය | බදු ආදායම හා හිඟ බදු ආදායම රැස්කිරීම සඳහා නිවැරදි ක්‍රමවේදයක් නොතිබුණු අතර බදු ආදායම් රැස්කිරීමට අදාල නියමයන් හා කොන්දේසි ක්‍රියාත්මක කර නොතිබීම. |
| (ඈ) | අත්තිකාරම් ලබාදීම හා පියවීම | මුදල් රෙගුලාසි ප්‍රකාරව ලබාගත් අත්තිකාරම් පියවා නොතිබුණි |
| (ඉ) | කොන්ත්‍රාත් පරිපාලනය | කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන මණ්ඩලයකින් ඉටුකර නොගෙන ප්‍රාදේශීය ප්‍රසම්පාදන මණ්ඩලය මගින් අනුමැතිය ලබාගත හැකිවන පරිදි කිසිදු පදනමකින් තොරව කාර්යයන් වෙන්කර තිබුණි. |
| (ඊ) | විවිධ ව්‍යාපෘති පරිපාලනය | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හෝ පරිසර ඇගයීම් වාර්තා ලබාගැනීම හා අනෙකුත් අදාල ආයතන වලින් අනුමැතිය ලබා නොගැනීම. |
| (උ) | කාර්ය මණ්ඩල කළමනාකරණය | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු 14 ක් හා වෙනත් සේවක කාණ්ඩවල අතිරික්ත කාර්ය මණ්ඩලය 195 ක් පැවතීම. |
| (ඌ) | වාහන පාලනය | බාහිර පාර්ශවයන් සතු වාහන ආපසු ලබා ගැනීම හා වාහන සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ සිදුකර නොතිබීම. |